**අගලවත්ත ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට අගලවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල ලිපිද්‍රව්‍ය ණයට මිලදීගැනීම් රු.514,460 ක් තොග ගිණුම හර කිරීම වෙනුවට වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්වල පෙන්වීම හේතුවෙන් සැපයුම් හා උපකරණ වියදම රු.514,460 කින් වැඩියෙන් හා සැපයුම් උපකරණ තොග ගිණුම රු.514,460 කින් අඩුවෙන් ගිණුම්වල පෙන්වා තිබුණි.

(ආ) 2014 විගණන වාර්තාවේ 2.2.1(ඉ) අනුව පෙන්වා ඇති වරද නිවැරදි කිරීම සඳහා ණයහිමි ගිණුම රු.99,745 කින් හර කර සමුච්චිත අරමුදල එම වටිනාකමින් බැර කළ යුතු වුවද, ජර්නල් සටහන් 08 මගින් සමුච්චිත අරමුදල් ගිණුම රු.99,745 ක් හර කර එම ගිණුමට බැර කිරීම හේතුවෙන් ණයහිමි ගිණුම රු.99,745 කින් වැඩියෙන් හා සමුච්චිත අරමුදල් ගිණුම රු.99,745 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන ආධාර රු.7,273,757 ක් හා ප්‍රාග්ධන වියදම රු.7,273,757 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාලව දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ණය පොලිය රු.90,988 ක් හා සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු පොලිය රු.560,334 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් රු.556,160 ක පරිගණක යන්ත්‍ර වටිනාකම ප්‍රාග්ධන වියදමක් ලෙස ආදායම් වියදම් ගිණුමේ දැක්විය යුතු වුවත්, සැපයුම් හා උපකරණ වැය යටතේ දක්වා තිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

(අ) ගිණුම් විෂයයන් 8 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.54,470,927 ක් වූ අතර උපලේඛන අනුව ශේෂය රු. 51,546,592ක් විය.

(ආ) කර්මාන්ත ණයහිමි ලේඛනයට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමි වටිනාකම රු.607,945 ක් වුවත්, ලෙජර ගිණුම් අනුව රු.6,167,661 ක් වූයෙන් රු.5,559,716 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට හේතු අනාවරණය නොවුණි.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.23,045,625 ක් වූ ගිණුම් ශේෂ 4 ක්ද, ශේෂ සනාථ කිරීමේ ලේඛන හා ලියවිලි නොමැති නිසා එකතුව රු.12,885,675 ක් වූ ගිණුම් ශේෂ 2 ක්ද විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) 2010 වර්ෂයේ සිට පැවත එන ගෙවිය යුතු ජාතිය ගොඩගැනීමේ බදු ශේෂය රු.43,795 ක් සහ එකතු කළ අගය මත බදු ශේෂය රු.754,610 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට පැවත එන පාලින්දනුවර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු රු.7,543,251 ක ශේෂය හා පාලින්දනුවර ප්‍රාදේශීය සභාවෙන් ලැබිය යුතු රු.5,342,424 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අගලවත්ත ප්‍රාදේශීය සභාවේ ගිණුම් අනුව පාලින්දනුවරින් ලැබිය යුතු ශේෂය රු.5,342,424 ක් ලෙස දක්වා තිබූ අතර එය පාලින්දනුවර ගිණුම් අනුව රු.6,862,872 ක් ලෙසද, පාලින්දනුවරට ගෙවිය යුතු ශේෂය රු.7,543,251 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණද, පාලින්දනුවර ගිණුම් අනුව එය රු.6,166,759 ක් විය. ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිවැරදි කරගැනීම සඳහා ශේෂ සනාථ කිරීම් ලිපි ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 **නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්**

2015 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.69,658 ක වටිනාකම වූ චෙක්පත් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඇ) පරිදි කටයුතු කර නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.2,516,651 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායමට වඩා වැඩි වූ පුනරාවර්තන වියදම රු.5,277,810 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.1,074,437 ක් වූ හිඟ ආදායම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තියේ විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

2.2.2 **වරිපනම් බදු**

2015 ජනවාරි 01 දිනට රු.912,926 ක් වූ හිඟ හිටි වරිපනම් බදු ශේෂයෙන් 2015 දෙසැම්බර් 31 දින වන විට රු.579,205 ක් හෙවත් සියයට 63 ක් පමණක් අයකරගෙන තිබුණි.

2.2.3 **ප්‍රවාරක දැන්වීම් සඳහා ගාස්තු**

2014 නොවැම්බර් 28 දිනැති අංක 1891 දරන ගැසට් නිවේදනය අනුව ප්‍රවාරක දැන්වීම්/ නාම පුවරු 34 ක් සඳහා රු.168,889 ක් අයකරගැනීමට 2015 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

2.2.4 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 6,917,958 ක මුදලක් පහත පරිදි ලැබිය යුතුව තිබුණි.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 4,914,424 |
| මුද්දර ගාස්තු | 2,003,534 |

3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය